# 1.31 සිංහල භාෂාව උගන්වන ගුරුවරුන්ගේ ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

අනුරින් ඉන්දිකා දිවාකර
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.

## ABSTRACT

සිංහල භාෂාව ජාතික භාෂාව ලෙස සම්මත වී තිබුණ ද සමාජ කටයුතුවල දී භාවිත කිරීමේ දී පැන නැගී ඇත්තේ ගැටලු සහගත බවකි. ලංකාවේ ම පාසල් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් අ. පො . ස දක්වා අනිවාර්යයෙන් ම සිංහල භාෂාව ඉගෙන ගනු ලැබුව ද ඔවුන් සමාජයේ සාමාජිකයන් වශයෙන් සමාජයට එක් වී භාෂාව භාවිතයේ දී මෙන් ම භාෂාව නිසි ලෙස අධ්‍යයනයෙන් ලැබූ සංයමය නොමැති හෙයින් මුහුණ දෙන්නේ ගැටලු සහගත තත්ත්වයකට ය. සිංහල භාෂාව උගන්වන ගුරුවරුන් සම්බන්ධ ගැටලු මීට බලපාන එක් මූල සාධකයකි.

සිංහල භාෂාව උගන්වන ගුරුවරුන් සම්බන්ධ ගැටලු ප්‍රධාන අංශ දෙකකින් දැක්විය හැකිය. ගුරුවරුන් නිසා ඇති වන ගැටලු හා ගුරුවරුන්ට ඇති වන ගැටලු යි. මෙහි දී අවධානය යොමු වන්නේ ගුරුවරුන් නිසා ඇති වන ගැටලු කෙරෙහි ය. එහි දී ප්‍රායෝගික ව ඉගැන්වීම, සම්ප්‍රදායිකත්වයෙන් මිදීමට ඇති අකමැත්ත, සටහන්වල එල්ඹ සිටීම, උත්තර දී ප්‍රශ්නවලට ශිෂ්‍යයන් සූදානම් කිරීම, විෂය කරුණු අවශ්‍ය පරිදි අධ්‍යයනය නොකිරීම, කාලය අඩුකම, ඉගැන්වීමේ කුසලතා වර්ධනය කර නොගැනීම, ශිෂ්‍යයන් පිළිබඳ අවබෝධයක් ඇති කර නොගැනීම මෙන් ම ශිෂ්‍යයන් නිර්මාණකරණයට නොපෙළඹ වීම වැනි අංශ මුල් වේ.

මේ කරුණු මත ඇති වන ප්‍රතිඵලය වන්නේ පාසල්වලින් සමාජයට මුදාහරිනු ලබන සාමාජිකයන්ගෙන්, සමාජයට අවශ්‍යය කරනු ලබන සිංහල භාෂාව පිළිබඳ දැනුම ප්‍රමාණවත් අයුරින් නොලැබීම ය. එසේ ම සමාජ වගකීම් දරන බොහෝ දෙනෙකුගේ ම චින්තනය, නිර්මාණ හැකියාව හා රසවින්දනය පුළුල් පරාසයක් කරා විහි දී නොයන අතර සමාජ ප්‍රශ්නවලට මධ්‍යස්ථ ව මුහුණ දීමේ හැකියාව ද ඔවුන් සතු නොවීම යි.